2019 වසරේදී ශ්‍රී ලංකාව තුළ දිවි අහිමි කරගැනීම් 3,135 ක් පමණ වාර්තා වී ඇතැයි ශ්‍රී ලංකා පොලිසිය පවසයි. එය දිනකට සාමාන්‍යය ලෙසින් ගත් විටද දිනකට දිවි අහිමි කරගැනීම් 8.5 ක අගයකි. මෙනිසාම, දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම ඔස්සේ වක්‍රාකාරයෙන් දිවි අහිමි කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් නොසැපයීම උදෙසා, ආචාර ධාර්මික ප්‍රවේශයකින් යුතුව දිවි අහිමි කරගැනීම් වාර්තා කරන මෙන් මාධ්‍ය දිරිමත් කෙරේ.

දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති ආචාර ධර්ම තුළ, දිවි අහිමි කරගත් ආකාරය පළ නොකළ යුතු බව දැක්වෙන්නේ, ඒ ඔස්සේ තවත් අයෙකු එම ආකාරය භාවිතා කොට දිවි අහිමි කරගැනීමට නැඹුරු වීමේ හැකියාවක් ඇති නිසායි. එසේම දිවි අහිමි කරගැනීමට පාදක වූ කරුණ සරලව නොදැක්විය යුතු යැයි එම ආචාර ධර්මයන්හි දැක්වෙන්නේ, දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් පැවතිය හැකි නිසායි.

මීට අමතරව, උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු ඊට යොමු කිරීම ඔස්සේ එම ජීවිතය බේරාගැනීමට ඉඩක් විවෘත වනු ඇත.

එනිසා, සෑම විටම මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් හා අනුගත වෙමින් දිවි අහිමි කරගැනීම් වාර්තා කරන ලෙසට අපි සිහිපත් කරමු.
මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138?fbclid=IwAR0_N11vPtXHiuNw_vvxB8hsLp54ZyGOQUsOwaCskaOhF2azlrnj6ZJOZOU
https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1&fbclid=IwAR3CsZ4alpHfIHrpS7NidN_j82_IkSIV_WYtFi2TZ4KMeHQqD0clXYiK5S4
https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting?fbclid=IwAR1aYJmFJnvpDFyA9Qd3NmYgpyLFel7yrSUpbZlV_6HRnYjFTJfV02HUOfY

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Aruna